# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ සේවා අවශ්‍යතාවය මත කළමනාකරණ සහකාර තනතුර (කොන්ත්‍රාත් පදනම මත),තාක්ෂණ නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) (කොන්ත්‍රාත් පදනම මත) තනතුර සහ වැඩ සහයක තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර (කොන්ත්‍රාත් පදනම මත) – තනතුරු 02

අවශ්‍ය සුදුසුකම්:

1. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ
   i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

   යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) එක් වරක දී සමත් වී තිබීම.

   සහ

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

   (පැරණි විෂය නිර්දේශය යටතේ එක් වරකදී විෂයයන් 03ක් සමත් වීම ප්‍රමාණවත් වේ.)

3. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

   (a). පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු කාලයක පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

   සහ

   (b). පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

සටහන:-

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු 30ට නොවැඩි විය යුතුය.
(ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුයි.

වැටුප:- රුපියල් 30,725/= ක මාසික මූලික දීමනාවක් සහ අනෙකුත් රජයේ අනුමත දීමනා

කොන්ත්‍රාත් කාලය:- පත් වූ දින සිට මාස හයක්

තෝරා ගැනීම: ලිඛිත පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## තාක්ෂණ නිලධාරි(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) (කොන්ත්‍රාත් පදනම මත) – තනතුරු 01

**අවශ්‍ය සුදුසුකම්:**

1. අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සහ

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ තොරතුරු සන්නිවේදන සහ බහුමාධ්‍ය තාක්ෂණ / තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය / තොරතුරු ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක් විසින් පිළිගත් තාක්‍ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද N.V.Q මට්ටම 5 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකම්

3. තොරතුරු සන්නිවේදන තාක්ෂණය හි සේවා පළපුරුද්ද ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

වැටුප:- රුපියල් 31,625/= ක මාසික මූලික දීමනාවක් සහ අනෙකුත් රජයේ අනුමත දීමනා

**කොන්ත්‍රාත් කාලය:-** පත් වූ දින සිට මාස හයක්

**තෝරා ගැනීම:** ලිඛිත පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**වයස:** අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.

## වැඩ සහායක (කොන්ත්‍රාත් පදනම මත) – තනතුරු 01

**අවශ්‍ය සුදුසුකම්:**

1. වාර දෙකකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයන් හයක් (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

සටහන:-

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.
(ඇ) මනා චරිතයකින් සහ යහපත් සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

වැටුප:- රුපියල් 27,025/= ක මාසික මූලික දීමනාවක් සහ අනෙකුත් රජයේ අනුමත දීමනා

කොන්ත්‍රාත් කාලය:- පත් වූ දින සිට මාස හයක්

තෝරා ගැනීම:- ලිඛිත පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් (structured interview) මඟින්

**සටහන:- තෝරාගත් අපේක්ෂකයින් තම අදාල ඉපැයුම් වලින් 8%ක් සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායක විය යුතු අතර විශ්ව විද්‍යාලය අදාල ඉපයුම් වලින් 12%ක ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට සහ 3%ක් සේවක භාරකාර අරමුදල වෙත දායක වේ.**

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම අයදුම්පත් අමුණා ඇති ආකෘතියට අනුකූලව සකස් කර අදාල සහතිකවල සහතික කළ පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.
අයදුම්පත් යොමු කළ යුත්තේ:

**අධ්‍යක්ෂ, විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය**
තැ.පෙ. 02,
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,
බෙලිහුල්ඔය.

අයදුම්පත් 2024/12/17 හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැල මඟින් යොමු කළ යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

ප්‍රමාද හෝ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි අතර මේ පිළිබඳව විශ්ව විද්‍යාලයේ නිලධාරීන්ට කවර ආකාරයේ හෝ බලපෑමක් සිදු කිරීම තහනම් වේ.

අයදුම්කරුවන් ලුහුලේඛන (short list) කිරීම,තෝරා ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ අයදුම්පත් සලකා බැලීම පිළිබඳව පූර්ව දැනුම්දීමකින් තොරව තීරණ ගැනීමේ අයිතිය විශ්ව විද්‍යාලය සතු වේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
03/12/2024